පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 11

# තෙවන වාර පරීක්ෂණය - 2023

## සංගීතය (පෙරදිග) I, II

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................  කාලය : පැය 3යි

### සංගීතය (පෙරදිග) I

උපදෙස්

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

**අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

(01) ගපධනිසං යන ස්වර සංගතිය අයත් වන රාගය කුමක් ද?

(1) බිලාවල් (2) භූපාලි (3) කාෆි (4) යමන්

(02) යමන් සහ භූපාලි යන රාග අයත් ථාටය දැක්වෙන වරණය තෝරන්න.

(1) කාෆි (2) කල්‍යාණ (3) බිලාවල් (4) භෛරවී

(03) |ස රි ග ම | - ග - රි |ස - ධ̣ නි̣ |ස - - - | යන ස්වර ප්‍රස්තාරය භෛරවී රාගයට අනුව සකස් කිරීමට නම්, කෝමල විය යුත්තේ,

(1) ගාන්ධාරයයි

(2) නිෂාදයයි

(3) රිෂභය, ගාන්ධාරය හා නිෂාදයයි

(4) රිෂභය, ගාන්ධාරය, ධෛවතය හා නිෂාදයයි

(04) ශුද්ධ ගාන්ධාරය සහ ශුද්ධ නිෂාදය විවාදී ස්වර ලෙස යොදා ගත හැකි නිර්දේශිත රාගය කුමක් ද?

(1) භූපාලි (2) භෛරවී (3) කාෆි (4) යමන්

(05) රාග ජාතියට අනුව සම්පූර්ණ ජාතියට අයත් **නොවන** රාගය තෝරන්න.

(1) යමන් (2) භූපාලි (3) බිලාවල් (4) භෛරවී


(06) ස්වර සප්තකය තුළ අර්ධ ස්වර පරතරයක් සහිත ස්වර යුගලය කුමක් ද?

(1) ස , රි (2) රි , ග (3) ග , ම (4) ම , ප

(07) රාගධාරී සංගීතයේ දී පකඩ් (Pakad) ලෙස හඳුන්වන්නේ,

(1) රාග ජාතියයි (2) මේලයයි (3) ගාන සමයයි (4) මුඛ්‍යාංගයයි

- **පහත රූප සටහන මගින් හින්දුස්තානී තාලයක ආවර්තයක් චක්‍රාකාරව ගමන් කිරීම නිරූපණය කෙරේ. ප්‍රශ්න අංක 8 සිට 11 තෙක් ඒ ඇසුරින් පිළිතුරු සපයන්න.**




(08) ඉහත ආවර්තයෙන් දැක්වෙන තාලයේ නම කුමක් ද?

(1) දාදරා (2) කෙහෙර්වා (3) ජප් (4) දීප්චන්දි

(09) ඉහත තාලයට අදාළ ඨේකාවේ එක් විභාගයක් නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

(1) |ධා ධිං ධිං ධා| (2) |ධා ධිං -| (3) |ධ ගෙ න ති| (4) |ධි ධි න|

(10) ඉහත රූප සටහනේ පළමු සහ තුන්වන විභාගවලට එක් මාත්‍රාව බැගින් එකතු වූ විට නිර්මාණය වන තාලය කුමක් ද?

(1) ජප් තාලය (2) දීප්චන්දි (3) ත්‍රිතාල් (4) දාදරා

(11) ඉහත රූප සටහනේ ආකාරයට ම **විභාග සහ තාල සංඥා** යෙදෙන තාල පමණක් අඩංගු වරණය තෝරන්න.

(1) ත්‍රිතාල්, දාදරා, කෙහෙර්වා (2) ඛෙම්ටෝ, ලාවනී, දීප්චන්දි

(3) ජප්තාල්, ත්‍රිතාල්, කෙහෙර්වා (4) ලාවනී, ජප්තාල්, ත්‍රිතාල්

- **ප්‍රශ්න අංක 12 සිට 14 තෙක් පහත දැක්වෙන ජන ගී පාදය ඇසුරින් පිළිතුරු සපයන්න.**

**"ලක්ෂ්මී බුජවාසා - සතතු ජය"**

(12) ඉහත ගී පාදය අයත් ගී වර්ගය කුමක් ද?

(1) වන්නම් (2) හටන් ගී (3) සන්දේශ කාව්‍ය (4) ප්‍රශස්ති

(13) ඉහත ගී පාදය හිමි ගී විශේෂයේ දක්නට ලැබෙන විශේෂ කොටසක් වන්නේ කුමක්ද?

(1) මුද්‍රප්පදය (2) දොහොරාව (3) උරුට්ටුව (4) අඬහැරය

(14) එම ගී පාදය ගැයීමේ දී දීර්ඝතම යතියක් පිහිටන්නේ කුමන අක්ෂරය මතද?

(1) ල (2) වා (3) සා (4) මී

(15) පහතරට වන්නමක සහ සබරගමු වන්නමක අඩංගු වන කොටස් දෙකක් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) කස්තිරම, අඩව්ව (2) ඉරට්ටිය, කලාසම

(3) සීරුමාරුව, කස්තිරම (4) තානම, ඉරට්ටිය

- **නිර්දේශිත රංග ශෛලීන්ට අයත් ගීත කිහිපයක් පහත වගුවේ දැක්වේ.**

| A | B | C | S |
|---|---|---|---|
| පායාලා අඹරේ චන්ද්‍රයා දිසි | පෙර සිට පැවත එන සිරිතට පොදිය බැඳගෙන | වෙදා නටන්නේ පළමුව සබයට එන්නේ | රකිනු ඊශ්වරා මේ අප සැම සකල අපල |

(16) ABCD ගීත ඇතුළත් වන නාට්‍ය ශෛලීන් වන්නේ,

(1) A සොකරි, B කෝලම්, C නාඩගම්, D නූර්ති

(2) A කෝලම්, B සොකරි, C නූර්ති, D නාඩගම්

(3) A නූර්ති, B නාඩගම්, C කෝලම්, D සොකරි

(4) A නාඩගම්, B කෝලම්, C සොකරි, D නූර්ති

(17) A සහ B නාට්‍ය ශෛලීන් සඳහා වාදනය කරනු ලබන අවනද්ධ භාණ්ඩ පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) මද්දලය, යක් බෙරය (2) තබ්ලාව, ගැට බෙරය

(3) උඩැක්කිය, දවුල (4) මෘදංගය, ඩොල්කිය

(18) C නාට්‍ය ශෛලිය රඟ දැක්වූ ප්‍රදේශයක් සහ රඟ දැක්වූ ස්ථානය නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

(1) මීගමු දූව - කරළිය (2) බෙන්තර - තානායම් පොළ

(3) කොළඹ - වේදිකාව (4) මාතලේ - කමත

(19) D රංග ශෛලිය සඳහා ගී තනු නිර්මාණය කිරීමට දායක වූ භාරතීය සංගීතඥයෙකු වන්නේ,

(1) විශ්වනාත් ලව්ජී (2) කිෂෝර් කුමාර්

(3) දක්ෂිණ මූර්ති (4) මොහමඩ් ගවුස්

(20) රාගධාරී සංගීතය ආශ්‍රිතව නිර්මාණය වූ ග්‍රැමෆෝන් ගීත පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ශ්‍රී රාහුල හිමිගේ නාමේ, විසෙහී විස සඳහා, අඩු කළේ සෙලවීම නිසා

(2) මහ බෝධි මුලේ, මව්පියෝ ආදි, බැස සීතල ගඟුලේ

(3) දසබලධාරී, සිරි බුද්ධගයා විහාරේ, දූඩිකළ මාතා

(4) ශ්‍රී සෙත් සාදයි, මුනි නන්දන සිරිපාද, දුල් සල්වනේ ලකල්

(21) මෙරට ගුවන් විදුලි සරල ගීයට මුල් අත්තිවාරම සකස් කරන ලද්දේ,

(1) සුනිල් සාන්ත සහ නෙවිල් ප්‍රනාන්දු විසිනි.

(2) ආනන්ද සමරකෝන් සහ සෝමදාස ඇල්විටිගල විසිනි.

(3) සුනිල් සාන්ත සහ ලයනල් අල්ගම විසිනි.

(4) ආනන්ද සමරකෝන් සහ සුනිල් සාන්ත විසිනි.

(22) ''තෑර ඉස්ති තෑර'' යන පැරණි කපිරිඤ්ඤා ගීතයේ තනුව ඇසුරු කර ගෙන ඇති සරල ගීතය කුමක් ද?

(1) මී වදයකි ජීවිතේ (2) රස ආහාර කවලා

(3) යමං බණ්ඩො වෙසක් බලන්න (4) සිංහල රජ කාලේ නොවේ දූන් මේ කාලේ

- **ප්‍රශ්න අංක 23 සහ 24 ප්‍රශ්නවල හිස්තැන් සඳහා වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

(23) තාරතාවය නැතහොත් උච්චනීච භේදය යනු ……………….. යි.

(1) හඬෙහි සැර (2) තරංග රටාවේ වෙනස

(3) තරංග ආයාමය (4) හඬෙහි ඉහළ පහළ ස්වභාවය

(24) තත්පරයකදී සිදුවන කම්පන වාර ගණන ……………….. වේ.

(1) විපුලතාව (2) සංඛ්‍යාතය

(3) විස්තාරය (4) ධ්වනිගුණය

(25) සිතාරය, බටනලාව සහ තබ්ලාව යන වාද්‍ය භාණ්ඩ වාදනය කිරීමේ ප්‍රවීණ භාරතීය සංගීඥයින් පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) ශකීර් හුසේන්, රවි ශංකර්, හරි ප්‍රසාද් චෞරාසියා

(2) ජග්ජිත් සිං, ඒ.ආර්.රහ්මන්, ශකීර් හුසේන්

(3) රවි ශංකර්, හරි ප්‍රසාද් චෞරාසියා, ශකීර් හුසේන්

(4) ඒ.ආර්. රහ්මන්, රවි ශංකර්, ශකීර් හුසේන්

(26) F G A $B^b$ C D E F වශයෙන් ස්වර යෙදෙන බටහිර ස්කේලය නම් කර ඇති වරණය තෝරන්න.

(1) C Major Scale (2) C Minor Scale

(3) F Major Scale (4) F Minor Scale

(27) C Minor සහ G Minor යන කෝඩ්ස්වලට අදාළ ස්වර නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

(1) C $E^b$ G , G $B^b$ D (2) C E G , G B D

(3) C F G, G C D (4) C $E^b$ F, G $B^b$ D

(28) |ග - ම | ප - ග | ම - ග | රි - - | යන ස්වර පාදය සමග සුසංගත (Harmony) කිරීම සඳහා වඩාත් සුදුසු ස්වර පාදය කුමක් ද?

(1) |රි - ග | ම - රි | ග - රි | ස - - | (2) |ම - ප | ධ - ම | ප - ම | ග - - |

(3) |ප - ග | ධ - ප | ම - රි | ග - - | (4) |ප - ධ | නි - ප | ධ - ප | ම - - |

(29) යානි නැමැති බටහිර සංගීතඥයාගේ නිර්මාණයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ට්‍රිබියුට් (2) කෝරල්

(3) ද මැජික් ෆ්ලූට් (4) ජුපිටර්

(30) ඉන්දියානු ගායන ශිල්පිනී ලතා මංගේෂ්කාර් මහත්මිය ගායනා කළ සිංහල චිත්‍රපට ගීතය කුමක් ද?

(1) ශ්‍රීනි විභූෂිත ලංකා බැබළේ (2) සිරි දැරූ හෙළ දිව පුරාතනේ

(3) රන්වන් දූල් කරලින් පැසිලා (4) සුදු සඳ එළියේ නල මත පොපියන

(31) ''උන්මාද සිතුවම්'' හා ''කුල ගෙදරින්'' යන ගීත දෙක ඇතුළත් චිත්‍රපට පිළිවෙළින් සඳහන් වන වරණය කුමක් ද?

(1) සැඩ සුළං සහ රන්මුතු දූව (2) ගැටවරයෝ සහ සත්සමුදුර

(3) එක්ටැම්ගේ සහ හුලවාලි (4) රේඛාව සහ සත්සමුදුර

(32) ඉන්දීය සිනමාවේ විශිෂ්ට සංගීත අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ඇතුළත් වරණය තෝරන්න.

(1) ආර්.මුත්තුසාමි සහ නෞෂාඩ් (2) රවි ශංකර් සහ මොහිදීන් බෙග්

(3) මොහොමඩ් ගවුස් සහ දක්ෂිණ මූර්ති (4) එස්.ඩී.බර්මන් සහ නෞෂාඩ්

(33) ''ඉරෙන් හඳෙන් එළිය අරන්'' ''අන්දර යායේ වැව් තාවල්ලේ'' මෙම ගීත දෙක, ගැයීම ආරම්භ වන්නේ,

(1) සමග්‍රහයෙනි (2) අවග්‍රහයෙනි (3) සමස්ථානයෙනි (4) විෂමග්‍රහයෙනි

(34) ලයනල් රංවල මහතා විසින් නිර්මාණය කරන ලද ගීතයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) වන්නම් සවදම් ගායන (2) රුක් අත්තන මල මුදුනේ

(3) මල්සරා බැල්ම හෙළා (4) දෑතට වළලු

(35) ප්‍රකට I have a Dream (අයි හැව් අ ඩ්‍රීම්) ගීතය ගායනා කළේ,

(1) ඇබා සංගීත කණ්ඩයමයි. (2) ත්‍රී සිස්ටර්ස් සංගීත කණ්ඩායමයි.

(3) ජිප්සීස් සංගීත කණ්ඩායමයි. (4) ගෝල්ඩන් චයිම්ස් සංගීත කණ්ඩායමයි.


(36) බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණයේ wood wind (දැවමය සුෂිර) භාණ්ඩය දැක්වෙන වරණය තෝරන්න.

(1) ට්‍රම්පට් (2) සැක්සෆෝන්

(3) ත්‍රොම්බෝන් (4) ටියුබා

(37) බේස් ක්ලෙෆ් සලකුණ නිවැරදිව දක්වා ඇති රූපය තෝරන්න.

(1)  (2)  (3)  (4) 

(38)  බටහිර සංගීතයේ මෙම සලකුණෙන් අදහස් කරන්නේ කුමක් ද?

(1) මාත්‍රා එකක් නිශ්ශබ්ද බව දැක්වීම. (2) මාත්‍රා දෙකක් නිශ්ශබ්ද බව දැක්වීම.

(3) මාත්‍රා තුනක් නිශ්ශබ්ද බව දැක්වීම. (4) මාත්‍රා හතරක් නිශ්ශබ්ද බව දැක්වීම.

(39) යම් කිසි භාණ්ඩයක නාදය පටිගත කර, සංගීත නිර්මාණයක් සඳහා ප්‍රතිනිර්මාණය කර ගත හැකි අයුරින් සැකසීම හඳුන්වන්නේ,

(1) MIDI ලෙස ය. (2) E - Music ලෙස ය.

(3) Multi Track Recording ලෙස ය. (4) Sample Sound fonts ලෙස ය.

(40) සජීවී ප්‍රංසගයක දී හඬෙහි විචිත්‍රත්වය (Sound Effects) ඇති කිරීමට භාවිත කරන උපකරණය කුමක්ද?

(1) මයික්‍රෝෆෝනය (2) මික්සරය

(3) ඇම්ප්ලිෆයරය (4) ස්පීකර්

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 11 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

## සංගීතය (පෙරදිග) I, II

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

## සංගීතය (පෙරදිග) II

- **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- සියලු ම ප්‍රශ්න සඳහා ලකුණු 12 බැගින් හිමි වේ.

**(01) අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.**

(i) නි̣ රි ස -, නි̣ රි ග රි ස - , යනු නිර්දේශිත රාගයකට අයත් ස්වර අභ්‍යාසයක මුල් ස්වර ඛණ්ඩ දෙකකි. මෙම ස්වර අභ්‍යාසගේ ඊළඟට යෙදෙන ස්වර ඛණ්ඩය ලියන්න.

(ii) ''ඇත කඳුකර හිමව් අරණේ'' මෙම ගී පාදය ප්‍රස්තාර කිරීමේ දී පැහැදිලි ව පෙනෙන තාල ලක්ෂණය අනුව පහසුවෙන් ප්‍රස්තාර කළ හැකි වන්නේ කුමන තාලය මත ද?

(iii) රාගයක වැඩිම වාර ගණනක් යෙදෙන ස්වරය හඳුන්වන්නේ කුමන නමකින්ද?

(iv) ඩබ්ලිව්.බී.මකුලොලුව සූරීන් විසින් රචනා කරන ලද ජන සංගීත පර්යේෂණ කෘතිය නම් කරන්න.

- **අංක (v) සිට (viii) තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට පහත සඳහන් ගී පාද උපයෝගී කරගන්න.**
    - නොමදින් විකුම් පාලා
    - කවුරුදෝ අර කවුළුවෙන්
    - අපෙ මුනි සඳ එර්දි බලෙන්
    - මංගෝ කළු නැන්දේ
    - වගුරට නරනිඳු දඹදිව පරසිඳු

(v) භෛරවී රාගාශ්‍රිත සරල ගීයකට අයත් ගී පාදය තෝරා ලියන්න.

(vi) මහනුවර යුගයේ කවිකාර මඩුව හා සම්බන්ධ ගායන විශේෂයකට අයත් ගී පාදය තෝරා ලියන්න.

(vii) සිංහබාහු නාට්‍යයෙහි ඇතුළත් ගීතයකට අදාළ ගී පාදය තෝරා ලියන්න.

(viii) කණ්ඩායම් සංගීතය හරහා ජනප්‍රිය වූ ගීතයක ගී පාදය තෝරා ලියන්න. (ලකුණු 01 × 08 = 08යි)

- **අංක (ix) සහ (x) ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමඟ ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.**

(ix) රේඛාව චිත්‍රපටයේ ගී තනු නිර්මාණය කරන ලද්දේ ……………….විසින් වන අතර, ……………….. විසින් එහි සංගීත අධ්‍යක්ෂණය කරන ලදි.

(x) ගුත්තිල කාව්‍යයේ ඇතුළත් "සඳවා සුදු වැලි පිවිතුරු" යන පැදිය ……………….. විරිතට ද, "රූ රසේ අඳිනා ලෙසේ අත්" යන පැදිය, ……………….. විරිතට ද අයත් වේ. (ලකුණු 02 × 02 = 04යි)

(02) නිර්දේශිත රාග තුනකට අයත් මුඛ්‍යාංග පහත දැක්වේ.

A. මගු සරිස ධූ නිස

B. නිරි ගරිස පම´ ගරිස

C. ගරිසධ සරිග පග ධපග රිස

(i) A, B, C මුඛ්‍යාංග අයත් රාග පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03යි)

(ii) ඉහත රාග අතරින්, ගාන සමය සමාන වන රාග දෙක නම් කර, ඉන් එක් රාගයක මධ්‍යලය ඛ්‍යාල් ගීතයක හෝ ලක්ෂණ ගීතයක හෝ ස්ථායි කොටසෙහි ගීත ස්වර ප්‍රස්තාරය ලියන්න.

**නැතහොත්,**

එම එක් රාගයකට අයත් මධ්‍යලය වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කර, මාත්‍රා 08කට නොඅඩු තානාලංකාර දෙකක් තාලානුකූලව ප්‍රස්තාර කරන්න. (ලකුණු 06යි)

(iii) ABC රාග තුනේ මධ්‍යම ස්වර පිළිබඳ තොරතුරු වරහන් තුළින් තෝරා සම්පූර්ණ කරන්න. (විකෘති/වර්ජිත/වාදී/සංවාදී)

A රාගයේ මධ්‍යමය ………………. වේ.

B රාගයේ මධ්‍යමය ……………….වේ.

C රාගයේ මධ්‍යමය ………………. වේ. (ලකුණු 03යි)

(03)

(i) **ඨාට** යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03යි)

(ii) නිර්දේශිත රාග අතරින් ශුද්ධ ස්වර පමණක් යෙදෙන සම්පූර්ණ ජාති රාගයක් නම් කර, එම රාගයේ සර්ගම් හි අන්තරා කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 05යි)

(iii) කාෆි රාගයේ ස්වර යොදා ගනිමින්, ත්‍රිතාලයේ ආවර්ත දෙකකට ගැළපෙන නව ස්වර රචනාවක් නිර්මාණය කරන්න. (රාග සංගති අත්‍යවශ්‍ය නොවේ.) (ලකුණු 04යි)

(04)

(i) පහත සඳහන් ගැමි ගී පාද අදාළ වර්ගය අනුව වෙන් කරමින් පහත වගුව සම්පූර්ණ කරන්න.

- පෙරයම බුද්ධං සරණේ ගඤ්ඤයි
- බාල ළමාවරු නෙළුමට කැන්දන
- අතට වෙරළු ඇහිද ගෙනේ
- ඔයිරයිරේ ඔයිරාමා කොළ මැඩපන් ඔයිරාමා
- දොඩම් කපාලා ඇඹුල් තනාලා
- සීත ගඟුලෙදී ඇඳ පේ වෙනවා

| ගැමි ගී වර්ගය | ගැමි ගී පාද |
|---|---|
| මෙහෙ ගී | a) ……………………………………………… <br> b) ……………………………………………… |
| ඇදහිලි ගී | c) ……………………………………………… <br> d) ……………………………………………… |
| සමාජ ගී | e) ……………………………………………… <br> f) ……………………………………………… |

(ලකුණු 06යි)

(ii) **සේ ගී** යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(iii) කෙළි ගීයක මුල් පද පෙළක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04යි)


(05) පහත දැක්වෙන වාද්‍ය භාණ්ඩ ඇසුරෙන් පිළිතුරු සපයන්න.

A B C



(i) ABC රූපසටහන්වලින් දැක්වෙන වාද්‍ය භාණ්ඩ නම් කරන්න. (ලකුණු 03යි)

(ii) A භාණ්ඩයේ අක්ෂර උපදින ස්ථාන හතරක් අ, ආ, ඉ, ඊ මගින් දැක්වේ. එම අක්ෂර නම් කරන්න. (ලකුණු 04යි)




(iii) B හෝ C යන සංගීත භාණ්ඩ දෙකෙන් එක් භාණ්ඩයක දළ රූප සටහනක් ඇඳ, එම රූප සටහනෙහි, භාණ්ඩයට අදාළ කොටස් **පහක්** නම් කරන්න. (ලකුණු 05යි)

(06) මුල් යුගයේ ගුවන්විදුලි සරල ගීතයකින් තෝරා ගත් ගී තනු පාදයක අපරදිග සංගීත ස්වර ප්‍රස්තාරය පහත දැක්වේ.



(i) ඉහත දක්වා ඇති අපරදිග සංගීත ප්‍රස්තාරය පෙරදිග සංගීත ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න. (ලකුණු 08යි)

(ii) ඉහත ප්‍රස්තාරය අයත් ගීතය නම් කර එහි ගායන ශිල්පියාගේ නම ලියන්න. (ලකුණු 02යි)

(iii) ඉහත ප්‍රස්තාරයට අදාළ ටයිම් සිග්නේචරය (Time signature) හා එම ස්වර ප්‍රස්තාරය ලියා ඇති ස්කේලය (Scale) නම් කරන්න. (ලකුණු 02යි)

(07) පහත දැක්වෙන ප්‍රශ්න අතරින් ප්‍රශ්න **තුනක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.

(i) ජප් තාලය සහ දීප්චන්දි තාලය මත නිර්මාණය වී ඇති සරල ගී **දෙක බැගින්** පිළිවෙළින් නම් කරන්න.

(ii) බිතෝවන් සහ මොර්සාට් යන සංගීතඥයින් දෙදෙනාගේ නිර්මාණ **දෙක බැගින්** පිළිවෙළින් ලියන්න.

(iii) රාගාශ්‍රිත තූර්ති ගීත **දෙකක්** නම් කර, එම ගීත සඳහා පාදක කරගෙන ඇති රාග දෙකෙහි නම් ලියන්න.

(iv) සාම්ප්‍රදායික නාඩගම් ගී තනු ඇසුරු කරගෙන නිර්මාණය වූ නව නාට්‍ය ගීත **දෙකක්** හා එම ගීත සඳහා පාදක කරගෙන ඇති සාම්ප්‍රදායික ගීත දෙක පිළිවෙළින් නම් කරන්න.

(v) ව්‍යවහාරික සංගීතයේ ස්වර ලිපියක ඇතුළත් වන පහත සඳහන් සංකේත ලියා දක්වා, ඒවායේ අදහස කෙටියෙන් පැහැදිලි කරන්න.

- සයින් ටූ සයින් (Sign to sign)
- රිපිටේෂන් මාර්ක් (Repitation mark) (ලකුණු 04 × 3 = 12යි)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
11

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- **සංගීතය (පෙරදිග)**

පාසලේ නම : ........................................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................

කාලය :

## පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| 1 – (1) | 11 – (4) | 21 – (4) | 31 – (3) |
| 2 – (2) | 12 – (4) | 22 – (2) | 32 – (4) |
| 3 – (4) | 13 – (1) | 23 – (4) | 33 – (2) |
| 4 – (3) | 14 - (4) | 24 – (2) | 34 – (1) |
| 5- (2) | 15 – (2) | 25 – (3) | 35 – (1) |
| 6 –(3) | 16 – (4) | 26 – (3) | 36 – (2) |
| 7 – (4) | 17 – (1) | 27 – (1) | 37 – (2) |
| 8 – (4) | 18 – (4) | 28 – (4) | 38 – (1) |
| 9 – (2) | 19 – (1) | 29 – (1) | 39 – (4) |
| 10 – (3) | 20 – (1) | 30 – (2) | 40 – (2) |

## **II කොටස**

01

i) නි රි ග ම/ ග රි ස

ii) දීප්චන්දි තාලය මත/ මැදුම් මහ දෙතිත මත

iii) වාදී ස්වරය

iv) හෙළ ගී මග

v) කවුරුදෝ අර කවුළුවෙන්

vi) නොමදින් විකුම් පාලා

vii) වගුරට නරනිඳු දඹදිව පරසිඳු

viii) මංගෝ කළු නැන්දේ

ix) සුනිල් සාන්ත

x) බී.එස්. පෙරේරා

xi) දොළොස්මත් පැදි

xii) අටවිසිමත් පැදි

02

i) A භෛරවී B යමන් C භූපාලි

ii) නිවැරදි ස්වර ප්‍රස්තාරයට ලකුණු 04 යි
පද ප්‍රස්තාරයට ලකුණු 02 යි

- **වාදිතයක් නම්**
- ස්වර ප්‍රස්තාරයට ලකුණු 04 යි
- තානාලංකාර දෙකට ලකුණු 02 යි

iii) A - වාදී
B - විකෘති
C – වර්ජිත


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න